# සවියෙන් පෙරට අපි එකට

## e - ඉගෙනුම් කලාපය

## හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 6 | බුද්ධ ධර්මය | 3 | 17. මිහිඳු මා හිමි සමය වෙත යමු |

සැකසුම : ජේ. ඒ.ඩී.ඩී. භාග්‍යා ,
බප/ හො/ දේවරක්ෂිත මහා විද්‍යාලය,
මිල්ලනිය.

# බුද්ධ ධර්මය

## මිහිඳු මා හිමි සමය වෙත යමු....

- 6 වසර
- 17 පාඩම



- බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා වසර 236 දී පවත්වන ලද තුන්වන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රදේශ නවයකට ධර්ම ප්‍රචාරක භික්ෂු පිරිස් පිටත් කර යැවීමේ දී ලක්දිව ධර්ම ප්‍රචාරක සේවාවේ මූලිකත්වය ගනු ලැබුවේ මිහිඳු මහරහතන් වහන්සේ ය.....

- මිහිඳු මහරහතන් වහන්සේ සමඟ,

ඉට්ටිය, උත්තිය, සම්බල, භද්දසාල යන මහරහතන් වහන්සේලා සමඟ සුමන සාමණේර හා භණ්ඩුක උපාසක මෙරටට වැඩි සේක....

* අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේගේ පියා,

  භාරතයේ විසූ ධර්මාශෝක මහාධිරාජයා ය.

* පොසොන් පොහොය අපට වැදගත් වනුයේ,

  මහින්දාගමනය සිදු වූ නිසා ය.

* මිහිඳු හිමියන් මෙරටට වැඩම කරන විට මෙරට පාලකයා වූයේ,

  දේවානම්පියතිස්ස රජතුමා ය.

# මිහිඳු හිමි මෙරටට වඩින විට,

* දේවානම්පියතිස්ස රජු දඩයමේ යමින් සිටියේ ය.
* දඩයමේ යන රජුට මිහිඳු හිමියන් විසින් තිස්ස කියා අමතනු ලැබී ය. රජු පුදුම වී වටපිට බලන විට මිස්සක පව්ව මත සිටි පිරිස දැක ඔබ කවුරුන්දැයි විමසූ විට මිහිඳු මාහිමියන් මෙසේ පැවසී ය.

සමණාමයං මහාරාජා

ධම්මරාජස්ස සාවකා

තවේව අනුකම්පාය

ජම්බුදීපා ඉධාගතා

“මහරජ, අප ධර්මරාජයාණන් වහන්සේගේ ශ්‍රාවකයෝ වෙමු. ඔබට අනුකම්පා පිණිස දඹදිව සිට මෙහි පැමිණියෙමු.”

# මිහිඳු හිමි හා දේවානම්පියතිස්ස රජු අතර ඇති වූ දෙබස (අඹ ප්‍රශ්නය හා ඥාති ප්‍රශ්නය)

<u>අඹ ප්‍රශ්නය :</u>

"රජතුමනි, මේ ගස කුමක් ද?"

"ස්වාමීනි, මෙය අඹ ගසකි."

" රජතුමනි, මේ අඹ ගස හැර තවත් අඹ ගස් තිබේ ද? "

"එසේ ය ස්වාමීනි, තවත් අඹ ගස් තිබේ."

" රජතුමනි, මේ අඹ ගසත් ඒ අඹ ගසුත් හැර තවත් ගස් තිබේ ද? "

" එසේ ය ස්වාමීනි, නමුත් ඒවා අඹ ගස් නොවේ."

" රජතුමනි, ඒ අඹ ගසුත් අඹ නොවන ගසුත් හැර තවත් ගස් තිබේ ද? "

" එසේ ය ස්වාමීනි, ඒ මේ අඹ ගසයි."

## <u>ඥාති ප්‍රශ්නය :</u>

“රජතුමනි, ඔබට නෑයෝ සිටිත් ද?”

“එසේ ය ස්වාමීනි, බොහෝ සිටිති.”

“ රජතුමනි, ඔබට නොනෑයෝත් සිටිත් ද? ”

“එසේ ය ස්වාමීනි, බොහෝ සිටිති.”

“ රජතුමනි, එම නෑයොත් නොනෑයොත් හැර තවත් අය සිටිත් ද? ”

“ එසේ ය ස්වාමීනි, ඒ මමයි.”

* දේවානම්පියතිස්ස රජුට මිහිඳු හිමි දෙසූ සූත්‍රය,
    - චූල්ලහත්ථිපදෝපම සූත්‍රය
* චූල්ලහත්ථිපදෝපම සූත්‍රය දේශනා කිරීමෙන්,
    - රජු ඇතුළු පිරිස සෝවාන් වූ උපාසකයන් විය.
    - සුමන සාමණේර රහත් බවට පත්විය.
    - භණ්ඩුක නම් අනගාමී උපාසකතුමා පැවිදි විය.
* අනුරාධපුරයට වැඩි මිහිඳු හිමි දෙසූ ධර්මය අසා,
    - අනුලා දේවිය ඇතුළු පන්සියයක් පිරිස සෝවාන් විය.

මිහිඳු මහරහතන් වහන්සේ ඇතුළු පිරිසට රාත්‍රී කාලයේ වැඩ සිටීමට මහමෙව්නා උයන පූජා කරන ලදී. එහි ඉදිකළ මුල්ම ගොඩනැගිල්ල කාලපාසාද පිරිවෙන විය. එය අපගේ මුල්ම පන්සල වේ.

* මිහිඳු මහරහතන් වහන්සේ වස් විසුවේ,
  - චේතියගිරියේ දී (වර්තමානයේ මිහින්තලය)

* බුද්ධ ශාසනයේ පැවිද්ද ලැබූ ප්‍රථම ශ්‍රී ලාංකිකයා,
  - අරිට්ඨ කුමාරයා

- ශ්‍රී ලංකාවට බුදු දහම ලැබීමෙන් පසුව ඉදි වූ ප්‍රථම ස්ථූපය ථූපාරාම චෛත්‍ය යි.
- එහි බුදුන් වහන්සේගේ දකුණු අකු ධාතුව නිදන් කොට ඇත.
- එය පඨමක චේතිය නමින් ද හැඳින්වේ.

දේවානම්පියතිස්ස රජු විසින් ඉදි කරන ලද වෙහෙර, විහාර, ආරාම ආදිය.....

- ඉස්සර සමණ විහාරය (ඉසුරුමුණිය)
- වෙස්සගිරිය
- චේතියගිරිය
- පැන් පොකුණු
- සංඝාරාම
- සීමා මාලකයක්

# මහින්දාගමනයෙන් අපට ලැබුණු දායාද .....

- අවිධිමත් ඇදහිලි වල වල නිරතව සිටි ලක්වැසියන්ට විධිමත් පූද පූජා ක්‍රමයක් ලැබීම.
- භික්ෂු සමාජය ඇති වීම.
- සර්වඥ ධාතු වැඩමවීම.
- ස්ථූප ඉදිවීම.
- දුමින්දාගමනය
- දේශීය සාහිත්‍යය පෝෂණය වීම.
- අධ්‍යාපනය සංවර්ධනයට පත්වීම.

## ක්‍රියාකාරකම :

1. මිහිඳු මහරහතන් වහන්සේ ලක්දිව දේශනා කළ ප්‍රථම සූත්‍ර දේශනාව කුමක් ද?
2. මහින්දාගමනය චිත්‍රයට නගන්න.
3. පහත වගුව පුරවන්න.

| මිහිඳු මාහිමියන් සමඟ ලංකාවට වැඩම කළ පිරිස | පළමු ශ්‍රී ලාංකික භික්ෂුව වන්නේ | මුල්ම පන්සල | මුල්ම ස්ථූපය හා එහි තැන්පත් කළ ධාතූන් වහන්සේ |
|---|---|---|---|
| | | | |

# පිළිතුරු:

1. චුල්ලහත්ථිපදෝපම සූත්‍රය

2. මිහිඳු හිමියන් ලක්දිවට වැඩම කිරීම තමන් කැමති ආකාරයට චිත්‍රයට නගන්න.

3. අ.පි.බ →

| මිහිඳු මාහිමියන් සමඟ ලංකාවට වැඩම කළ පිරිස | පළමු ශ්‍රී ලාංකික භික්ෂුව වන්නේ | මුල්ම පන්සල | මුල්ම ස්ථූපය හා එහි තැන්පත් කළ ධාතූන් වහන්සේ |
|---|---|---|---|
| ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල , සුමන සාමණේර හා භණ්ඩුක උපාසක | අරිට්ඨ කුමරු | කාලපාසාද පිරිවෙන | ථූපාරාමය<br><br>බුදුන් වහන්සේගේ දකුණු අකු ධාතුව නිදන් කොට ඇත. |

# සැකසුම :-



ජේ. ඒ. ඩී. ඩී. භාග්‍යා
බප/ හෝ/ ශ්‍රී දේවරක්ෂිත මහා විද්‍යාලය
මිල්ලනිය
077 - 8325742